# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2088/54 – 2018 සැප්තැම්බර් මස 12 වැනි බදාදා – 2018.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

මධ්‍යම පළාත් සභාව

ගම්පොල නගර සභාව

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගම්පොල නගර සභාවේ ලේකම් විසින් තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියෙන් දෙවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

ආර්. එම්. පී. එස්. රත්නායක,
ලේකම්,
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය.

2018 පෙබරවාරි මස 14 වැනි දින,
පල්ලෙකැලේ දී ය.

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ අංක (2) 1 වන වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව ගම්පොල නගර සභා බල ප්‍රදේශයේ විනෝද බදු අයකිරීම සඳහා විනෝද බදු ආඥාපනතේ තුන්වන වගන්තියේ විස්තර කර ඇති පරිදි විනෝද සංදර්ශන වන විට ඇතුළුවීම සඳහා කරන ලද ගෙවීම්වලින් රු. 1.00 සිට රු. 200 දක්වා 10% බද්දක් ද, රු. 201 සිට රු. 500 දක්වා 12% බද්දක් ද, රු. 501 ට වැඩි 15% බද්දක් හා සිනමා ශාලාවල ප්‍රවේශපත්‍ර වටිනාකමින් 7.5% බද්දක් ද අයකිරීමට නගර සභා පනතේ 27(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරන්නීය.

09 – 766

1A – PG 4223 – 32 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*